# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2013 අංක 21 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 අප්‍රේල් මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2013 අංක 21 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 24 වන දින]

එල්. ඩී.— ඕ. 18/2013

### (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2013 අංක 21 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 13 වන වගන්තියේ (6) වන උපවගන්තියේ ''රුපියල් දහයක් වූ ගාස්තුවක්'' යන වචන වෙනුවට ''රුපියල් දහයක් වූ ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් මුදලක්'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ''රුපියල් පහක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක්'' යන වචන වෙනුවට ''රුපියල් පහක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් මුදලක්'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''ගාස්තු. 48. අමාත්‍යවරයා විසින් කලින් කල, නියම කරනු ලබන පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ඒවා අදාළ වන කාරණා සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතු ය.''.

2 —PL 007093 -3,340 (2013/03)

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ I වන කොටසේ—

(i) එහි 6 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(6) පූර්වාවධාන දැන්වීමක විස්තර කර ඇති එක් එක් ඉඩම සඳහා, ඒ එක් එක් පූර්වාවධාන දැන්වීම ලියාපදිංචි කරන එක් එක් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයකට වසර දෙකක කාලයක් සඳහා ගාස්තුව— රු. 2,500.00";

(ii) එහි 9 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(9) ප්‍රකාශිතවම නිදහස් කරනු නොලැබූ කවර හෝ අන්දමේ වූ නීත්‍යානුකූල සාධන පත්‍රයකට වුව ද ගාස්තුව— රු. 100.00";

(iii) එහි 10 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(10) 29 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්- ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන සාධන පත්‍රයක් සඳහා ගෙවිය යුතු අනෙකුත් ගාස්තුවලට අතිරේකව ගාස්තුව— රු. 1,000.00";

(2) එම උපලේඛනයේ III වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"III වන කොටස

| | රු. ශත |
|---|---|
| (1) යවන ලද හෝ භාර දෙන ලද ඔප්පුවල සාධනපත්‍රවල හෝ ලේඛනවල දෙවන පිටපත් නැතහොත් ඒවායේ සාක්ෂි දැරූ පිටපත් හෝ සහතික කරන ලද පිටපත් පරීක්ෂා කිරීම සඳහා හෝ II, III, IV, V, හෝ VI වන පරිච්ඡේද යටතේ යම් පොතක් හෝ සූචියක් පරීක්ෂා කිරීමට, පරීක්ෂා කරනු ලබන එක් එක් ගණුදෙනුව හෝ කාරණය සඳහා ගාස්තුව— | 500.00 |
| (2) (අ) යම් ඉඩමකට අදාළ යම් ඔප්පුවක පිටපත් හෝ උධෘත ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සඳහා ගාස්තුව— | 500.00 |
| (ආ) යම් ඉඩමකට අදාළව යම් පත්‍රිරුවක් හෝ පත්‍රිරුවල පිටපත් හෝ උධෘත ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සඳහා ගාස්තුව— | 100.00 |
| (3) 43 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පූර්වාවධාන දැන්වීමක් ලියාපදිංචි කිරීම හැර, ලිස්පෙන්ඩනයක්, පූර්වතා දැන්වීමක්, තහනම් පූර්වතා දැන්වීමක් ලියාපදිංචි කිරීම පිළිබඳ සටහනක් සැපයීමට ගාස්තුව, එබන්දක් ලියාපදිංචි කිරීමේ දී ගෙවනු ලැබූ ගාස්තුවම විය යුතු ය.". | |

**6.** 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන්නා වූ දිනයෙන් අවසන් වන කාලය දක්වා යම් ගාස්තුවක් අයකිරීම සඳහා හෝ එකතු කිරීම සඳහා මේ පනත මගින් බලය දී ඇති යම් කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් නැතහොත් මේ පනත යටතේ බලය පවරන ලද යම් තැනැත්තකු විසින් අයකරනු ලබන හෝ එකතු කරනු ලබන යම් ගාස්තු රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා විසින් හෝ මේ පනත යටතේ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් වලංගු ලෙස අය කරනු ලැබ හෝ එකතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය: වලංගු වීම.

එසේ වුව ද, ඉහත කී විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ දී අයකරනු ලබන හෝ එකතු කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් කරනු ලබන තීරණයකට හෝ නියමයකට නැතිනම් යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නඩු කටයුතු සඳහා බලනොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.